# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No: 10120

ෆැක්ස් / தொலைநகல / Fax: 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone: 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site: www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail: dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO: 1436 / 2023

ඔබේ අංකය / உமது இலக்கம் / Your No: / 2023 திகதி

දිනය / Date: 17/11/2023 පැය 0600

## මාධ්‍ය නිවේදනය

**01. අයිස් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - තලංගම පොලිස් ස්ථානය.**

2023.11.16 වන දින සවස් කාලයේ තලංගම පොලිස් වසමේ බත්තරමුල්ල මංසන්දියේදී තලංගම පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 600 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 25 ක් වන කහහින්න, පින්දෙනිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

තලංගම පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

**02. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මීගමුව පොලිස් ස්ථානය.**

2023.11.16 වන දින රාත්‍රී කාලයේ මීගමුව පොලිස් වසමේ කුඩාපාඩුව ප්‍රදේශයේදී මීගමුව පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 320 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 27 ක් වන පෙරියමුල්ල, මීගමුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මීගමුව පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

**03. තීරු බදු රහිතව මෙරටට ගෙන්වන ලද කෘෂි රසායනික ද්‍රව්‍ය සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - දිවුලපිටිය පොලිස් ස්ථානය.**

2023.10.16 වන දින දිවුලපිටිය පොලිස් වසමේ දිවුලපිටිය නගරයේදී දිවුලපිටිය පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර තීරුබදු රහිතව මෙරටට ගෙන්වන ලද EMAMECTIN BENZOATE 5% SG PRISON වර්ගයේ පැකට් 499 ක්, THIAMETHOXAM 25% WG IMAGE පැකට් 999 ක්

හා ප්‍රවාහනයට යොදාගත් ත්‍රීරෝද රථයද සමඟින් සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 30 හා 36 වයස්වල පසුවන නොරොච්චෝලේ ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

දිවුලපිටිය පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි

## 04. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - සිරිපුර පොලිස් ස්ථානය.

2023.11.16 වන දින උදෑසන කාලයේදී සිරිපුර පොලිස් වසමේ නවගහඇල ප්‍රදේශයේ නිවසකදී සිරිපුර පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 52 ක් වන නුවරගල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සිරිපුර පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 05. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - වාලච්චේන පොලිස් ස්ථානය.

2023.11.16 වන දින දහවල් කාලයේදී වාලච්චේන පොලිස් වසමේ තොප්පිගල වලමණ්ඩිය ප්‍රදේශයේ පැළක තිබියදී වාලච්චේන පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 46 ක් වන දෙහිඅත්තකණ්ඩිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

වාලච්චේන පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 06. මාරක රිය අනතුරක් - වැලිපැන්න පොලිස් වසම.

2023.11.16 වන දින උදෑසන කාලයේ වැලිපැන්න පොලිස් වසමේ මතුගම අළුත්ගම ප්‍රධාන මාර්ගයේ නුගගහලන්ද හන්දිය අසලදී මතුගම දෙස සිට අළුත්ගම දෙසට ධාවනය වූ මෝටර් රථයක් එම දෙසටම ධාවනය වූ පා පැදියක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පාපැදිකරු සීනිවත්ත රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 51 ක් වූ දර්ගානගරය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය පශ්චාත් මරණ පරීක්ෂණ කටයුතු සඳහා නාගොඩ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් මෝටර් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. වැලිපැන්න පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 07. මාරක රිය අනතුරක් - පිටකොටුව පොලිස් වසම.

2023.11.16 වන දින රාත්‍රී කාලයේ පිටකොටුව පොලිස් වසමේ බැස්ටියන් මාවත පිවිසුම අසලදී, හෝමාගම දෙස සිට පිටකොටුව දෙසට පැමිණි පුද්ගලික බස් රථයක් බැස්ටියන් මාවතට ඇතුල් කිරීමට යාමේදී බැස්ටියන් මාවත හරහා ගමන් කළ පදික කාන්තාවක් බස් රථයෙහි දකුණු පස බදෙහි ගැටී එම බස් රථයේ පිටුපස දකුණු පස රෝදයට යටවීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදික කාන්තාව කොළඹ ජාතික රෝහලට ඇතුලත් කිරීමෙන් අනතුරුව මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 58 ක් වූ ගුණසිංහපුර, කොළඹ 12 ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

පශ්චාත් මරණ පරීක්ෂණ හා හදිසි මරණ පරීක්ෂණ පවත්වා මෘත ශරීරය ඥාතීන්ට භාර දී ඇත. අනතුර සම්බන්ධයෙන් බස් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. පිටකොටුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 08. මාරක රිය අනතුරක් - මහියංගනය පොලිස් වසම.

2023.11.16 වන දින රාත්‍රී කාලයේ මහියංගනය පොලිස් වසමේ ඇලැවෙල ප්‍රදේශයේදී මහියංගනය දෙස සිට බදුල්ල දෙසට ගමන් කල යතුරුපැදියක් මාර්ගයේ ගමන් කල පදික පුද්ගලයෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරුපැදිකරු හා සුළු තුවාල ලැබූ පදිකයා මහියංගනය රෝහලට ඇතුලත් කර ඇති අතර යතුරුපැදිකරු ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 37 ක් වන දඹබරාව ප්‍රදේශයේ පදිංචිව සිටි මහියංගනය පොලිස් ස්ථානයේ රාජකාරී කරන ලද පොලිස් සැරයන්වරයෙකි.**

මෘත ශරීරය මහියංගනය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. මහියංගනය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**